සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

8 ශ්‍රේණිය | කතෝලික ධර්මය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

### I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1- 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ලූක් සුබාරංචියේ ආරම්භක සිදුවීම කුමක්ද?

    (1) ජේසුස් වහන්සේගේ වංශාවලියයි.

    (2) ස්නාවක ජොහාන් තුමාගේ පාළුකරයේ දේශනයයි.

    (3) මරියාවන්ගේ උදාන ගීයයි.

    (4) සෙකරියස් තුමාගේ යාග පූජාවයි.

02. යෙසායා දිවැසිවරයා සඳහන් කරන අන්දමට පාළුකරයේ මොරගසන හඬ ලෙස හඳුන්වන්නේ කවුරුන්වද?

    (1) ස්නාවක ජොහාන් තුමා ය.　　(2) සෙකරියස් තුමා ය.

    (3) ශු. ලූක් තුමා ය.　　(4) ශු. වාක් තුමා ය.

03. ජේසුස් වහන්සේගේ දේව පුත්‍රභාවය ප්‍රකාශ වූ අවස්ථාවක් වන්නේ,

    (1) ජේසුස් වහන්සේගේ උත්ථානය

    (2) ජේසුස් වහන්සේගේ බෞතිස්ම ස්නාපනය අවස්ථාව

    (3) ජේසුස් වහන්සේගේ කානා නුවර වතුර වයින් බවට හැර වූ අවස්ථාව

    (4) ජේසුස් වහන්සේ මල් උයනේ යාච්ඤා කළ අවස්ථාව

04. දාවිත් රජතුමාගෙන් ලෝක ගැලවුම්කරුවාණන් පැමිණෙන බව ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ,

    (1) මීකා ය.　　(2) යෙසායා ය.　　(3) නාතාන් ය.　　(4) සාමුවෙල් ය.

05. "මා මෙය දැනගන්නේ කෙසේද? මම මහල්ලෙක්මි. මාගේ භාර්යාවද වයස්ගතව සිටී." මෙලෙස ප්‍රකාශ කරන ලද්දේ,

    (1) සෙකරියස් තුමා ය.　　(2) ජුසේතුමා ය.　　(3) ඊසාක් තුමා ය.　　(4) ආබ්‍රහම් තුමා ය.

06. ඉශ්‍රායෙල් ජනතාව බැබිලෝනියාවේ වහලුන් ලෙස විප්‍රවාසගතවීමට හේතුව වන්නේ,

    (1) මිත්‍යා ඇදහිලි අනුගමනය කළ නිසා ය.

    (2) ජෝශප් ගැන නොදත් නව රජෙක් පත් වූ නිසා ය.

    (3) දස පනත කඩ කළ නිසා ය.

    (4) කැරලිකාර ජනතාවක් වූ නිසා ය.

07. දෙවියන් වහන්සේට "අබ්බා පියාණනි" යනුවෙන් ඇමතීමට හැකියාව ලැබෙන්නේ කුමන ප්‍රසාද නිධානයෙන්ද?

(1) ප්‍රසාද ස්නාපනය (2) අභිවෘද්ධි ආලේපය

(3) පාපොච්චාරණය (4) දිව්‍ය සත්ප්‍රසාදය

08. ගිහි සැදැහැවතුන් යාම යැදුම සඳහා සහභාගී වන අවස්ථාව වන්නේ,

(1) උදා යාම යැදුම ය. (2) දිවා යාම යැදුම ය.

(3) සන්ධ්‍යා යාම යැදුම ය. (4) රාත්‍රී යාම යැදුම ය.

09. පැරණි ගිවිසුමේ ගිවිසුම් කරඬුව අලංකාර කරනු පිණිස සාදන ලද රූපය වන්නේ,

(1) ලෝකඩ සර්පයා ය. (2) කෙරුබ්වරු ය. (3) රන් වස්සා ය. (4) ගව රූපය ය.

10. අභිවෘද්ධි ආලේපය දේව ප්‍රසාද නිධානයේ බාහිර සලකුණ වන්නේ,

(1) අපේක්ෂකයාගේ දෑත ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම.

(2) අපේක්ෂකයාගේ හිස මත ජලය වත්කිරීම.

(3) අපේක්ෂකයාගේ නළල ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම.

(4) අපේක්ෂකයාගේ හිස ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම.

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්න සඳහා හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.**

11. ජේසුස් වහන්සේගේ උපත පළමුවෙන්ම ප්‍රකාශ කළේ ........................................................................ න්ට ය.

12. ජෙරුසලමේ සිට ජෙරිකෝවට ගිය මිනිසාට සොරු පහර දී වස්ත්‍ර පැහැරගෙන තලා පෙලා ගියවිට ඔහුට දයාව දැක්වූයේ ......................................................................... මිනිසෙකි.

13. ජේසුස් වහන්සේ සිය ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කළේ ................................................................. ප්‍රදේශයෙන් ය.

14. .................................................... පව්කරුවකු ලෙස සලකා කොන් කරනු ලැබුවත් ජේසුස් වහන්සේ ඔහු යහමගට ගත් සේක.

15. මුහුදු වෙරළක ඇවිදිමින් සිටියදී ශුද්ධවූ ත්‍රිත්වය වටහා ගැනීමට උත්සාහ කළේ ............................................................... ය.

( සමාරිය / දුප්පත් එඬේරු / සකේවුස් / ශු. අගුස්තීනු තුමා / ගලීල )

- **අංක 16 - 20 දක්වා ප්‍රකාශ හරි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

16. භාරයක් නොවීම ඔබට පාපයක් නොවේ. (..........)

17. දෙවියන් වහන්සේට උතුම්ම ගෞරවය දීම සඳහා උන්වහන්සේ අකමැති දේ නොකිරීම දේව භය වේ. (..........)

18. ධර්මානුශාසනාව ස්තෝත්‍ර යාගික පිළිවෙතට අයත් ය. (..........)

19. අතීන්ද්‍රීය ක්‍රිස්තු දේහය යනු ක්‍රිස්තුන් වහන්සේ ය. (..........)

20. පදක්කම් පැළඳීම කිතුනු ජීවිතයේ විශ්වාසය හා බැඳී පවතින ක්‍රියාවලියකි. (..........)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (1) "ලාඕස්" හා "එර්ගොන්" යන්නෙහි අර්ථය ලියන්න.

(2) දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් 02 නම් කරන්න.

(3) ක්‍රිස්තුන් වහන්සේගේ ළමා කාලය පිළිබඳ සඳහන් කරන සුවිශේෂකවරුන් දෙදෙනා නම් කරන්න.

(4) ජේසුස් වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්ය වර්ග 02 ක් නම් කරන්න.

(5) ලූක් සුබාරංචිය හඳුන්වන වෙනත් නම් 02 ක් ලියන්න.

(6) දිව්‍ය සත්ප්‍රසාද භෝජනයට සූදානම් වන ආකාර 02 ක් නම් කරන්න.

(7) ඉරුදිනය ස්වාමීන් වහන්සේගේ දිනය ලෙස නම් කිරීමට හේතු වන කරුණු 02 ක් ලියන්න.

(8) පුදසුන සූදානම් කිරීමේ පිළිවෙතට අයත් අංග 02 ක් නම් කරන්න.

(9) ශුද්ධාත්මයාණන් වහන්සේ හැඳින්වීමට පුරාණ ගිවිසුමේ භාවිත කරන නම් 02 ක් ලියන්න.

(10) කතෝලික විශ්වාසයට අනුව කිතුනුවන් විසින් නොකළ යුතු මිත්‍යා ඇදහිලි 02 ක් ලියන්න.

(ල. 2x10=20)

02. (1) ස්නාවක ජොහාන් තුමාගේ දෙමාපියන් නම් කරන්න. (ල. 02)

(2) ස්නාවක ජොහාන් තුමාගේ දේශනය යොමු වූ කණ්ඩායම් 03 ක් නම් කරන්න. (ල. 03)

(3) කිතුනු දරුවකු ලෙස ඔබට ස්නාවක ජොහාන් තුමාගේ ජීවිතයෙන් ගතහැකි ආදර්ශ 05 ක් ලියන්න. (ල. 05)

03. (1) දේව රාජ්‍යය යනු කුමක්ද? (ල. 02)

(2) වපුරන්නා පිළිබඳ උපමාවේ සඳහන් අන්දමට වැපිරීමට රැගෙන ගිය බීජ වැටුණු ස්ථාන 03 ක් නම් කරන්න. (ල. 03)

(3) ධනපතියා හා ලාසරස් උපමාවට අනුව දේව රාජ්‍යය ළඟාකර ගැනීමට ඔබට කළ හැකි කාර්යයන් 05 ක් ලියන්න. (ල. 05)

04. (1) දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්‍ෂණ 02 ක් ලියන්න. (ල. 02)

(2) දිව්‍ය සත්ප්‍රසාදයේ පූර්ව ලක්‍ෂණ 03 ක් ලියන්න. (ල. 03)

(3) දිව්‍ය සත්ප්‍රසාදයෙන් ජීවමාන වූ ජේසුස් වහන්සේව ලබාගත් ඔබ කළ යුතු යහපත් ක්‍රියා 05 ක් ලියන්න. (ල. 05)

05. (1) ලූක් සුබාරංචියේ පරමාර්ථය කුමක්ද? (ල. 02)

(2) ලූක් සුබාරංචියේ අඩංගු පණිවිඩ 03 ක් ලියන්න. (ල. 03)

(3) ඔබ පන්ති කාමරයේ අනෙක් සිසුන් කොන් කළ සිසුවෙකු වෙනුවෙන් ඔබට කළ හැකි කාර්යයන් 05 ක් ලියන්න. (ල. 05)

06. (1) අභිවෘද්ධි ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් 02 ක් ලියන්න.(ල. 02)

(2) ශුද්ධාත්ම දීමනා 03 ක් ලියන්න. (ල. 03)

(3) අභිවෘද්ධි ආලේපය ලැබුවෙකුගේ යුතුකම් 05 ක් ලියන්න. (ල. 05)

07. (1) XII වන පියුස් ශුද්ධෝත්තම පියතුමා විසින් ජනවන්දනාව පිළිබඳව අර්ථකථනය කරන විශ්වලේඛනය කුමක්ද? (ල. 02)

(2) ජනවන්දනාවේ ප්‍රධාන අංග 03 ක් ලියන්න. (ල. 03)

(3) දිව්‍ය පූජාවට අර්ථවත් ලෙස සහභාගී වීමට ඔබට කළහැකි කාර්යයන් 05 ක් ලියන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 4 ) 02. ( 1 ) 03. ( 2 ) 04. ( 3 ) 05. ( 1 ) 06. ( 1 ) 07. ( 2 ) 08. ( 3 ) 09. ( 2 ) 10. ( 3 )

11. දුප්පත් එඬේරු 12. සමාරිය 13. ගලීල 14. සකේවුස් 15. ශු. අගුස්තීනු තුමා

16. (✓) 17. (✓) 18. (x) 19. (x) 20. (✓) (ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (1) ලාඕස් → දේව ජනතාව ♦ එර්ගොන් → සේවයකි, වැඩකි.
(2) දේව වාක්‍ය පිළිවෙත ♦ ස්තෝත්‍ර යාගික පිළිවෙත
(3) ශු. මතෙව් ♦ ශු. ලූක්
(4) ස්වභාව ධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්යය ♦ රෝගීන් සුව කිරීම හා සම්බන්ධ ප්‍රාතිහාර්යය ♦ දුෂ්ටාත්ම දුරුකිරීම හා සම්බන්ධ ප්‍රාතිහාර්යය ♦ මළවුන් උත්ථාන කිරීම හා සම්බන්ධ ප්‍රාතිහාර්යය
(5) යාච්ඤාවේ සුබාරංචිය ♦ දයාවේ සුබාරංචිය (07 පිටුව)
(6) ආත්මික සූදානම ♦ ශාරීරික සූදානම
(7) ජේසුස් වහන්සේගේ උත්ථාන වූ දිනය ♦ උත්තාන වූ ජේසුස් වහන්සේ වැඩිපුරම දර්ශන වූ දිනය ♦ ශුද්ධාත්මාගමනය සිදු වූ පෙන්තකොස්ත දිනයයි. (82 පිටුව)
(8) පඬුරු පෙරහැර හා පුදසුන සූදානම් කිරීම ♦ පඬුරු මත යැදුම.
(9) ආත්මානුභාවය ♦ දේවාත්මානුභාවය ♦ ශුද්ධාත්මය
(10) නැකත් බැලීම ♦ යන්ත්‍ර මන්ත්‍ර ♦ බලි තොවිල් ♦ ගුරුකම් ♦ ලග්න පලාපල (73 පිටුව) (ල. 2x10=20)

02. (1) සෙකරියස් තුමා ♦ එළිසබෙත් තුමිය (ල. 02)
(2) සමාජයේ ඉහළ ම මට්ටමේ වැජඹුණ ප්‍රභුවරුන් ♦ නොසන්සුන් වූ ජනතාව ♦ අයකැමියන් ♦ හමුදා නිලධාරීන් ( 28, 29 පිටු) (ල. 03)
(3) දෙවියන් වහන්සේ තුළ ජීවත් වීම. ♦ තත්ත්වය බලය ගැන නොසිතා සත්‍ය වෙනුවෙන් කතා කිරීම. ♦ අසාධාරණය හෙලා දැකීම. ♦ වැරදි මාර්ගවල යන අය නිවැරදි මාර්ගයට ගැනීම. ♦ දෙව වචනය අන් අයට කියා දීම......... ආදී සිසුවා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 05)

03. (1) දේව රාජ්‍යය යනු, දෙවියන් වහන්සේගේ පාලනයට නතුවීමය. ♦ පාපය ඉවතලා දේව වරප්‍රසාද තුළ ජීවත් වීම. ♦ දේව අභිමතයට මිනිස් සමාජය නතුවීම. (36 පිටුව) (ල. 02)
(2) මඟ දිගේ වැටුණු බීජ ♦ පස් නැති ගල් බිමේ වැටුණු බීජ ♦ කටු අතර වැටුණු බීජ ♦ සරු බිමෙහි වැටුණු බීජ (37 පිටුව) (ල. 03)
(3) ධනවත්කම නිසා සුඛෝපභෝගී ජීවිත ගත කරන අයද දුප්පතුන් අමතක නොකර ඔවුන්ට සැලකීම. ♦ දේව රාජ්‍යය දිනාගැනීමට නම් අසරණයන්ට පිහිට වීම. ♦ අපට ලැබී ඇති හැකියා හා කුසලතා දියුණු කර ගෙන අන් අයගේ යහපත පිණිස යොමු කිරීම. ♦ සියලු දෙනාට සහෝදරත්වයෙන් සැලකීම. ♦ සහෝදරයා වෙනුවෙන් තම යුතුකම නිසිලෙස ඉටු කිරීම. (40 පිටුව) (ල. 05)

04. (1) දේව ප්‍රසාද නිධානයකි. ♦ භෝජනයකි. ♦ ස්තුති කිරීමකි. ♦ යාගයකි. ♦ සිහිකිරීමකි. ♦ ගිවිසුමකි. (43 පිටුව) (ල. 02)
(2) මෙල්කිසෙදෙක්ගේ යාගය ♦ මන්නා භෝජනය ♦ ඉශ්‍රායෙල් ජනතාවගේ පාස්කු භෝජනය ♦ පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්ය (49 පිටුව) (ල. 03)
(3) දේව වචනය තුළ ජීවත් වීම. ♦ සියලු දෙනා සමඟ ප්‍රේමයේ ජීවිතයක් ගත කිරීම. ♦ අන් අයට දේව වචනය කියා දීම. ♦ වැරදි මාර්ගවල යන තම මිතුරු මිතුරියන් නිවැරදි මාර්ගයට ගැනීම. ♦ සමාජයේ කොන් වූ අසරණ වූවන්ට පිහිට වීම. ♦ ජේසුස් වහන්සේව අන් අයට හඳුන්වා දීම.... ආදී සිසුවා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 05)

05. (1) ජේසුස් වහන්සේ ජුදා ජනතාවගේ පමණක් නොව මුළු මිනිස් සංහතියේම ගැලවුම්කරුවා බව. (ල. 02)
(2) ප්‍රීතිය හා තුති පැසසුම. ♦ තමන් සතු දෙය වගකීමෙන් යුතුව පරිහරණය කිරීම. ♦ ආගමික වත් පිළිවෙත්. (12, 13 පිටු) (ල. 03)
(3) එම සිසුවා සමඟ මිත්‍ර වීම. ♦ එම සිසුවාට ආදරයෙන් කතා කිරීම. ♦ එම සිසුවා තමා විසින් පිළගෙන ඇති බැවින් අන් සිසුන් මෙන් පන්තිකාමරය තුළ සිටීමට අවස්ථාව ලබා දීම. ♦ ජේසුසු වහන්සේ පිළිබඳව කියා දීම. ♦ විවිධ වැඩ කටයුතු වලදී එම සිසුවාට නායකත්වය ලබාදීම........ ආදී සිසුවා ලිය ඇති කරුණු සලකා බලන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

06\. (1) ප්‍රසාද ස්නාපනය ලබා තිබීම. ♦ වයස අවුරුදු 14 සම්පූර්ණ කර තිබීම. ♦ ඉෂ්ට වරප්‍රසාද ඇතිව සිටීම. ♦ නිසි ධර්මෝපදේශයක් ලබා තිබීම. ♦ ප්‍රසාද නිධානය ලබා ගැනීමට ඇති ආශාව හා උනන්දුව (60 පිටුව) (ල. 02)

(2) ප්‍රඥාව ♦ තේරුම් ගැනීම. ♦ දැනුමැතිකම ♦ ධෛර්යය ♦ දැනගැන්ම ♦ දේව භක්තිය ♦ දේවභය (61 පිටුව) (ල. 03)

(3) තමාගේ විශ්වසය ගැඹුරු කර ගැනීම සඳහා උන්වහන්සේ පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම. ♦ ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ස්ථිර ප්‍රේමයක් ඇතිකර ගෙන එලෙස ජීවත් වීම. ♦ අවශ්‍ය අවස්ථාවලදී ක්‍රිස්තු ප්‍රේමය සඳහා නැගී සිට එයට සාක්ෂි දැරීම. ♦ ක්‍රිස්තුන් වහන්සේ හා එක්වී ලෝකය ශුද්ධවන්තභාවයට පත් කිරීම සඳහා සෑම උත්සහයක්ම දැරීම. ♦ පරිණත කිතුනුවෙකු ලෙස වචනයෙන් හා ක්‍රියාවෙන් සාක්ෂි දැරීම. ........ සිසුවා ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 05)

07\. (1) දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ (85 පිටුව) (ල. 02)

(2) දිව්‍ය පූජාව ♦ දේව ප්‍රසාද නිධාන ♦ යාම යැදුම (88 පිටුව) (ල. 03)

(3) දිව්‍ය පූජාව ආරම්භයේ සිට අවසානය දක්වාම පූජාවට සහභාගී වීම. ♦ ආත්මික හා ශාරීරික සූදානමකින් පූජාවට සහභාගී වීම. ♦ ගීතිකා, කියවීම, පිළිතුරු ගීය වැනි දෑ කියවීම හා ගායනා කිරීම. ♦ දිව්‍ය පූජාව අතර තුර අනවශ්‍ය කතා බහෙන් වැළකී සිටීම. ♦ පඬුරු පෙරහැරට සහභාගී වීම. ♦ ගෞරවයෙන් යුතුව දිව්‍ය සත්ප්‍රසාද වහස්සේ ලබා ගැනීම............ ආදී සිසුවා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 05)